# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,099 — 1960 අප්‍රේල් 1 වැනි සිකුරාද — 1.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් ශාඛාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 247 | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 251 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| වැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 252 | රට සීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ වැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බංකිරාදිය විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

දීමනා.—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායාර් සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. නවප්‍රවේශක නිලධාරීනු.—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවක් හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැනෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරිහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

3. උපන් ස්ථානය :————.

(අ) ඉල්ලුම්කරු :————.

(ආ) ඉල්ලුම්කරු ගේ පියා :————.

(ඇ) ඉල්ලුම්කරු ගේ පියාගේ පියා :————.

(ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේත් පියා :————.

4. ඉල්ලුම්කරු උපන් දින හා 1960 ජනවාරි මස 1 වන දිනට වයස :————.

5. (අ) ඉල්ලුම්කරු ගේ ජාතිය :————.

(ආ) ලාංකිකයකු නම් ලියාපදිංචි වීමෙන් ද, පරම්පරාගතව ද යන වග :————.

6. දැනට කරන රක්‍ෂාව—විස්තර සහිතව (ගුරුවරයකු/වරියකු නම් සේවය කරන පාසැලේ නම ලියාපදිංචි වීමේ අංකය, දැනට ලැබෙන වාර්ෂික වැටුප හා වැටුප් ක්‍රමය ලියන්න.)

7. අධ්‍යාපන සුදුසුකම් :————.

8. පෙරදිග සංගීතය හා/හෝ නැටුම් පිළිබඳ සුදුසුකම් :————.

9. ඉගැන්වීමේ පළපුරුද්දක් ඇත්නම් එය (ඉගැන්වීමේ කාල පරිච්ඡෙදය සවිස්තරවද, ඒ ඒ පාසැලෙන් අස්වීමට හේතු වූ කරුණු ද ලියන්න).

10. සිංහල හෝ දෙමළ පිළිබඳ දැනුම හෝ සිංහල හෝ දෙමළ පිළිබඳව සාමර්ථ්‍යය ලබා ඇති ඉහළම පන්තිය :————.

11. වෙනත් සුදුසුකම් :————.

12. චරිත සහතික දී ඇති අය ගේ නම් :————.

————,
අයදුම්කරු ගේ අත්සන.

දිනය :————.

සැ.යු.—ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන ලියුම් කවරයේ උඩ වම් කෙළවරෙහි "සංගීත සහ නැටුම් ගුරු තනතුරු" යන පාඨය සඳහන් කරන්න.

---

## ගුවන් විදුලි දෙපාර්තමේන්තුව

**කණිෂ්ඨ (පාඨශාලා) වැඩසටහන් සහායක තනතුර, දෙමළ**

ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ ස්වදේශීය සේවයේ කණිෂ්ඨ දෙමළ (පාඨශාලා) වැඩසටහන් සහායක තනතුරක් සඳහා මෙයින් ඉල්ලුම් පත් කැඳවනු ලැබෙයි. මෙම දැන්වීමේ පා මුල දැක්වෙන ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු අයදුම්පත්, 1960 අප්‍රේල් 15 වැනි දින නොඉක්මවා ලැබෙන සේ, කොළඹ, තැ. පෙ. 574, ලංකා ගුවන් විදුලි ආයතනයේ, ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල් නමට එවිය යුතුයි. ආකෘති පත්‍ර වෙන ම සපයනු නොලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "කණිෂ්ඨ (පාඨශාලා) වැඩසටහන් සහායක දෙමළ" යන්න පැහැදිලි අකුරෙන් ලිවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය : රු. 2,700—10×120, 6×180—රු. 4,980කි.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර තාවකාලිකය. මුල් වතාවේ තනතුර දෙනු ලබන්නේ තුන් වසක සෝදිසි කාලයකට ය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින් ම යට දැක්වෙන කරුණු ස්ඵුට කෙරෙන සෑහෙන සාක්‍ෂ්‍ය ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1960 අප්‍රේල් 15 වැනි දිනට වයසින් 21ට නොඅඩු හා 40ට නොවැඩි බව, (රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් වෙනුවෙන් මේ වයස් සීමා බල පවත්වන්නේ නැත) ;

(ආ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධිධරයකු බව ; එසේ නැත්නම්,

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් හෝ සමත් දෙමළ පුහුණු ගුරු සහතිකය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයයක අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ සතු වූවකු බව ;

(iii) විශෙෂයෙන් නොඑක් වයස් තරාතිරම්වලට ඉගැන්වීමේ පළපුරුදුකම් ඇත්තකු බව.

තවද, දෙමළ සාහිත්‍යය, කලා හා සංගීතය, විද්‍යාව ආදී විෂයයන් පිළිබඳව හා ලාංකික ජනතාවගේ ඉතිහාසය, සංස්කෘතිය, හා චාරිත්‍ර, වාරිත්‍ර පිළිබඳ සාමාන්‍ය දැනුමක් ද දෙමළ රචනයේ දක්‍ෂතාවයක් හා ගුවන් විදුලි ප්‍රචාර කටයුතු පිළිබඳ පළ පුරුද්දක් ද විශෙෂ සුදුසුකම් සේ සැළකේ.

(ඇ) මනා චරිතයක් හා කායික සුවයකින් යුක්ත වූවකු බව.

5. අයදුම්කරුවන් විසින් යට සඳහන් ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොව) ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි—

(i) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතික හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කළ උප්පැන්න සහතික මේ සඳහා පිළිගනු නොලැබේ.)

(ii) ඉහළ ම අධ්‍යාපනික සුදුසුකම් දැක්වෙන සහතිකය සහ

(iii) අයදුම්කරුගේ චරිතය, සුදුසුකම්, කාර්යක්‍ෂමතාව සහ තනතුරට පත්කිරීමට ඇති යෝග්‍යත්වය දැක්වෙන මෑතක දී ලබාගත් සහතික දෙකක්. (රජයේ සේවයේ යෙදී සිටින අයදුම් කරුවන්ගෙන් මේ උප ඡේදය යටතේ සහතික අනවශ්‍යය)

**සැළකිය යුතුයි :**

මේ සහතික පිටපත් අයදුම්කරුවන් වෙත පෙරළා එවනු නොලැබේ. මුල් ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ සම්මුඛ පරීක්‍ෂණයකට කැඳවුව හොත් හා එවිටය.

6. නියමිත දින ඉක්මවා මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියමිත කාල සීමාව තුළ දී ලැබී ඇත්නම් හා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයට වලංගු හේතු දක්වමින් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් එය පිළිගන්නා මෙන් නිර්දේශ කළහොත් මිස, පිළිගනු නොලැබේ.

7. රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් මෙම ගැසට් පත්‍රයේ I කොටසේ II ඡේදයේ මුල දැක්වෙන පොදු කොන්දේසි බලන්න.

8. ඉල්ලුම් පත් හෝ ඒ පිළිබඳ සෙසු ලියවිලි හෝ එවිය යුත්තේ ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල් නමට මිස මෙම දෙපාර්තමේන්තුවේ අනෙක් නිලධාරියකුගේ පුද්ගලික නමට නොවේ.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

එන්. එස්. වික්‍රමසිංහ,
වැඩබලන ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්.

1960 අප්‍රේල් 1 වැනි දින,
කොළඹ 7.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**කණිෂ්ඨ (පාඨශාලා) වැඩසටහන් සහායක තනතුර—දෙමළ**

1. සම්පූර්ණ නම (අච්චු අකුරෙන් ලියන්න) :————.

(අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.

(ආ) සෙසු නම් :————.

2. ස්ථිර ලිපිනය :————.

3. 1960 අප්‍රේල් 15 වැනි දිනට නියම වයස :
අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය (උප්පැන්න සහතික පිටපත ඇමිණිය යුතුයි) :————.

4. ජාතිය—

(1) ලාංකිකත්වය පෙළපතින්ද ලියාපදිංචි කිරීමෙන්ද යන වග :————.

(2) ලාංකිකත්වය පෙළපතින් නම් යට සඳහන් අය උපන් තැන දන්වන්න :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඉ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඊ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

5. අධ්‍යාපනික සුදුසුකම් (සාක්ෂ්‍ය ලෙස ඇමුණූ ලියවිලි කවරේද ?) :————.

6. ගුවන් විදුලි ප්‍රචාර කටයුතු හා ගුවන් විදුලි වැඩසටහන් පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද. (අමුණා ඇති ලියවිලි කවරේද ?) :————.

7. අමුණා එවන චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපින :————.

8. සේවාමුක්ත භටයින් උදෙසා පිරිනැමෙන අනුග්‍රාහයෙන් ප්‍රයෝජන ගන්නේද යන වග (එසේ නම්, සේවාවෙන් අස්වීමේදී ලබාගත් සහතිකය හෝ සමාන සාක්ෂිවල පිටපත් ඇමිණිය යුතුයි.) :————.

9. තේරීමේදී සැළකුවමනා විශේෂ ඉල්ලුම්, සුදුසුකම් හා පළපුරුදු කම්වල විස්තර :————.

10. රජයේ සේවයේ කිසි කලෙක යෙදී සිටියේ නම් ඒ කවදා කොතැනද යන වග :————.

(ඒ ඒ දෙපාර්තමේන්තුවල සේවය කළ කාලපරිච්ඡේදයන් සඳහන් කළයුතුයි.)

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## ගුවන් විදුලි දෙපාර්තමේන්තුව

**කණිෂ්ඨ (පාඨශාලා) වැඩසටහන් සහායක තනතුර—සිංහල**

ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ සවදේශීය සේවයේ කණිෂ්ඨ (පාඨශාලා) වැඩසටහන් සහායක තනතුරක් සඳහා මෙයින් ඉල්ලුම් පත් කැඳවනු ලැබෙයි. මෙම දැන්වීමේ පාමුල දක්වෙන ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු අයදුම්පත්, 1960 අප්‍රේල් 15 වැනි දින නොඉක්මවා ලැබෙන සේ, තැ. පෙ. 574, ලංකා ගුවන් විදුලි ආයතනයේ, ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල් නමට එවිය යුතුයි. ආකෘති පත්‍ර වෙත ම සපයනු නොලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "කණිෂ්ඨ (පාඨශාලා) වැඩසටහන් සහායක, සිංහල" යන්න පැහැදිලි අකුරෙන් ලිවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය**—මෙම තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය : රු. 2,700—10×120, 6×180—රු. 4,980කි.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි**—මෙම තනතුර තාවකාලිකය. මුල් වතාවේ තනතුර දෙනු ලබන්නේ තුන් වසක සෝදිසි කාලයකට ය.

4. **අවශ්‍ය සුදුසුකම්**—සෑම අයදුම්කරුවෙකු විසින් ම යට දක්වෙන කරුණු ස්ථිර කෙරෙන සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1960 අප්‍රේල් 15 වැනි දිනට වයසින් 21ට නොඅඩු හා 40ට නොවැඩි බව, (රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් වෙනුවෙන් මේ වයස් සීමා බල පවත්වන්නේ නැත) ;

(ආ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධිධරයකු බව ; එසේ නැත් නම්,

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් හෝ සමත් සිංහල පුහුණු ගුරු සහතිකය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයයක අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ හිමි වූවකු බව ;

(iii) විශේෂයෙන් නොඑක් වයස් තරාතිරම්වලට ඉගැන්වීමේ පළපුරුදුකම් ඇත්තකු බව.

තවද, සිංහල සාහිත්‍යය, කලා හා සංගීතය, විද්‍යාව, ආදී විෂයයන් පිළිබඳව හා ලාංකික ජනතාවගේ ඉතිහාසය, සංස්කෘතිය, හා චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ සාමාන්‍ය දැනුමක් ද සිංහල රචනයේ දක්ෂතාවයක් හා ගුවන් විදුලි ප්‍රචාර කටයුතු පිළිබඳ පළ පුරුද්දක් ද විශේෂ සුදුසුකම් සේ සැලකේ.

(ඇ) මනා චරිතයකින් හා කායික සුවයකින් යුක්ත වූවකු බව.

5. අයදුම්කරුවන් විසින් යට සඳහන් ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොව) ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතික හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කළ උප්පැන්න සහතික මේ සඳහා පිළිගනු නොලැබේ.)

(ii) ඉහළ ම අධ්‍යාපනික සුදුසුකම් දක්වෙන සහතිකය ; සහ

(iii) අයදුම්කරුගේ චරිතය, සුදුසුකම්, කාර්යශූරත්වය සහ තනතුරට පත්කිරීමට ඇති යෝග්‍යත්වය දක්වෙන මෑතක දී ලබාගත් සහතික දෙකක්. (රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගෙන් මේ උප ඡේදය යටතේ සහතික අනවශ්‍යය).

**සැළකිය යුතුයි.**—මේ සහතික පිටපත් අයදුම්කරුවන් වෙත පෙරළා එවනු නොලැබේ. මුල් ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවුව හොත් හා එවිටය.

6. නියමිත දින ඉක්මවා මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියමිත කාල සීමාව තුළ දී ලැබී ඇත්නම් හා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයට වලංගු හේතු දක්වමින් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් එය පිළිගන්නා මෙන් නිර්දේශ කළහොත් මිස, පිළිගනු නොලැබේ.

7. රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් මෙම ගැසට් පත්‍රයේ I කොටසේ II ඡේදයේ මුල දක්වෙන පොදු කොන්දේසි බලන්න.

8. ඉල්ලුම් පත් හෝ ඒ පිළිබඳ සෙසු ලියවිලි හෝ එවිය යුත්තේ ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල් නමට මිස මෙම දෙපාර්තමේන්තුවේ අනෙක් නිලධාරියකුගේ පුද්ගලික නමට නොවේ.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

එන්. එස්. වික්‍රමසිංහ,
වැඩබලන ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්.

1960 අප්‍රේල් 1 දින,
කොළඹ 7.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**කණිෂ්ඨ (පාඨශාලා) වැඩ සටහන් සහායක තනතුර—සිංහල**

1. සම්පූර්ණ නම (අච්චු අකුරෙන් ලියන්න) :————.

(අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.

(ආ) සෙසු නම් :————.

2. ස්ථිර ලිපිනය :————.

3. (අ) 1960 අප්‍රේල් 15 වැනි දිනට නියම වයස :
අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය (උප්පැන්න සහතික පිටපත ඇමිණිය යුතුයි) :————.

4. ජාතිය—

(1) ලාංකිකත්වය පෙළපතකින්ද ලියාපදිංචි කිරීමෙන්ද යන වග :————.

(2) ලාංකිකත්වය පෙළපතින් නම් යට සඳහන් අය උපන් තැන දන්වන්න :————.

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඉ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඊ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

5. අධ්‍යාපනික සුදුසුකම් (සාක්ෂ්‍ය ලෙස ඇමුණු ලියවිලි කවරේද ?) :————.

6. ගුවන් විදුලි ප්‍රචාර කටයුතු හා ගුවන් විදුලි වැඩසටහන් පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද. (අමුණා ඇති ලියවිලි කවරේද ?) :————.

7. අමුණා එවන චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපින :————.

8. සේවාමුක්ත හටයින් උදෙසා පිරිනැමෙන අනුග්‍රහයෙන් ප්‍රයෝජන ගන්නේද යන වග (එසේ නම්, සේවාවෙන් අස්වීමේදී ලබාගත් සහතිකය හෝ සමාන සාක්ෂිවල පිටපත් ඇමිණිය යුතුයි.) :————.

9. තේරීමේදී සැළකුවමනා විශේෂ ඉල්ලුම්, සුදුසුකම් හා පළපුරුදු කම්වල විස්තර :————.

10. රජයේ සේවයේ කිසි කලෙක යෙදී සිටියේ නම් ඒ කවදා කොතැනද යන වග :————.

(ඒ ඒ දෙපාර්තමේන්තුවල සේවය කළ කාලපරිච්ඡේදයන් සඳහන් කළයුතුයි.)

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාරයේ අංකය : 1/83/7(ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීමේ (ඉංග්‍රීසි) විභාගය—1959යේ ඔක්තෝබර් මස

වර්ෂ 1959 ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී පහත සඳහන් අස්ථිර සහ පරීක්ෂණ කාල සීමාවනට යටත් ව පත්වීම් ලබා ඇති ලඝු ලේඛකයන් හා ලඝු ලේඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| අතුකෝරාල, සී. ජී. එම්. (මහත්මිය) | කර්මාන්ත | ඉංග්‍රීසි සහ සිංහල |
| කරුණාරත්න, එම්. ඩී. එම්. (මෙනෙවිය) | ඇටෝර්නි ජනරාල්ගේ | සිංහල |
| කැප්පෙටිපොල, කිව්. | දිස්ත්‍රික් උසාවිය, අනුරාධපුරය | ඉංග්‍රීසි |
| ක්‍රිසොස්ටම්, ආර්. ඒ. බී. | විදුලි කර්මාන්ත | ඉංග්‍රීසි |
| ගයිනන්, එච්. ටී. | ගුවන් විදුලි | ලඝු ලේඛනය |
| ගුණරත්න, එම්. ඒ. බී. (මෙනෙවිය) | ප්‍රසිද්ධ වැඩ | ඉංග්‍රීසි |
| ගුණරත්න, කේ. ඩී. පී. | දේශීය ආදායම් | ඉංග්‍රීසි |
| ජයසිංහ, කේ. | සමාජ සේවා | ඉංග්‍රීසි සහ සිංහල |
| ද සිල්වා, එම්. එල්. ඒ. (මහත්මිය) | තැපැල් | ඉංග්‍රීසි |
| දිසානායක, ඩී. සෙන්ට් සී. | විභාග | ඉංග්‍රීසි |
| පීටර්, පී. ඩී. | ප්‍රසිද්ධ වැඩ | ඉංග්‍රීසි සහ සිංහල |
| පීරිස්, ජේ. ඩබ්ලිව්. | අධිකරණ අමාත්‍යාංශය | සිංහල |
| පෙරේරා, ටී. ඒ. ටී. පී. එම්. | පොලිස් | ඉංග්‍රීසි සහ සිංහල |
| පෙරේරා, ජේ. ඒ. එස්. | සෞඛ්‍ය | ඉංග්‍රීසි සහ සිංහල |
| පෙරේරා, ඩබ්ලිව්. එස්. | විදුලි කර්මාන්ත | ඉංග්‍රීසි සහ සිංහල |
| ප්‍රනාන්දු, ඩබ්ලිව්. ඩී. | කර්මාන්ත | ඉංග්‍රීසි සහ සිංහල |
| රත්නසාමි, ආර්. කේ. (මෙනෙවිය) | ගුවන් විදුලි | ඉංග්‍රීසි සහ දෙමළ |
| රාජසේකරම්, එස්. සී. | පොලිස් | දෙමළ |
| විජේසිංහ, එච්. එස්. | ඉඩම් සංවර්ධන | සිංහල |
| සමරසිංහ, පී. ඩී. වයි. | මාතලේ කච්චේරිය | ඉංග්‍රීසි සහ සිංහල |
| සවරිමුත්තු, එච්. ටී. ටී. | වාරිමාර්ග | දෙමළ |
| සිල්වියා, ජී. ඩබ්ලිව්. (මෙනෙවිය) | සෞඛ්‍ය | ලඝු ලේඛනය |
| සූරවීර, ඩී. එන්. ඕ. | කාලගුණ විද්‍යා | සිංහල |

2. පහත සඳහන් අපේක්ෂකයා සහ අපේක්ෂිකාව පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් දන් සමර්ථ වී ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| විජේසිංහ, එච්. එස්. | ඉඩම් සංවර්ධන |
| සිල්වියා, ජී. ඩබ්ලිව්. (මෙනෙවිය) | සෞඛ්‍ය |

එච්. ටී. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960 ක් වූ මාර්තු මස 28 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/7(ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—(සිංහල)

ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940 ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සම්බන්ධයෙන් වර්ෂ 1959 ක් වූ නොවැම්බර මස 21 වැනි දින පවත්වනු ලැබූ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයෙන් පහත සඳහන් ලඝු ලේඛිකාවන් සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි. ඔවුහු යථෝක්ත කාර්යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථ්‍යය ලැබීමට දන් සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| විල්සන්, ජේ. කේ. (මහත්මිය) | රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ |
| විල්සන්, ටී. (මහත්මිය) | කර්මාන්ත හා ධීවර කටයුතු අමාත්‍යාංශය |

එච්. ටී. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960 ක් වූ මාර්තු මස 28 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/7 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝුලේඛකයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—(ඉංග්‍රීසි)

ස්ථාන මාරුව සහිත ලඝු ලෙඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලෙඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමෙන් සාමාර්ථ්‍යය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සම්බන්ධයෙන් වර්ෂ 1959 ක්වූ නොවැම්බර් මස 17 වැනි දින පවත්වනු ලැබූ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයෙන් පහත සඳහන් ලඝු ලෙඛකයන් සහ ලේඛිකාව සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි. ඔවුහු යථෝක්ත කාර්යක්ෂමතා කඩ ඉමෙන් සාමාර්ථ්‍යය ලැබීමට දන් සුදුසුකම් ලබා ඇත.

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ජයසේකර, ඩී. ඩී. ඩබ්ලිව්. එම්. | අල්ලස් කොමිසන් සභාව |
| ජයසේකර, පී. ඩබ්ලිව්. එස්. | පළාත්පාලන |
| ඩග්ලස්, ආර්. | කෘෂිකර්ම |
| ද අල්මේදා, ජී. ඒ. | දිස්ත්‍රික් උසාවිය, ත්‍රිකුණාමලය |
| ද සිල්වා, එන්. බී. එම්. | දිස්ත්‍රික් උසාවිය, කළුතර |
| ධර්මතිලක, ඩබ්ලියු. | දිස්ත්‍රික් උසාවිය , ගාල්ල |
| පීරිස්, එම්. එස්. ආර්. එම්. | කැලෑ |
| පීරිස්, කේ. ජී. කේ. | කච්චේරිය, මහනුවර |
| ප්‍රනාන්දු, එම්. සී. | දිස්ත්‍රික් උසාවිය, කොළඹ |

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ප්‍රනාන්දු, එස්. | ජාතික නිවාස |
| ප්‍රනාන්දු, එස්. එස්. ඒ. | වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ |
| වික්‍රමසේකර, එල්. එන්. ජේ. | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| වීරකෝන්, ආර්. එම්. සී. (මහත්මිය) | ඇටෝර්නි ජනරාල්ගේ |
| වීරවර්ධන, ඩී. එස්. ද ඉසැඩ් | ආණ්ඩුවේ දේශ සංචාරක කාර්‍යාංශය |
| වීරසේන, එම්. එම්. | අගමැති කාර්‍යාලය |
| ෂෙරීෆ්, ඕ. | ඉන්දියානු සහ පකිස්තානු පදිංචිකරුවන් ලියාපදිංචි කිරීම පිළිබඳ |
| සේනානායක, ඒ. එම්. පී. ඒ. | රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය |

එච්. ඊ. පීරිස්.
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960 ක්වූ මාර්තු මස 28 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/7(ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ කාර්‍යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—(ඉංග්‍රීසි) 1959 යේ ඔක්තෝබර

වර්ෂ 1959 ක්වූ ඔක්තෝබර මස 10 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලෙඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලෙඛකයන්ගේ වාර්ෂික වෙතනය රුපියල් 2,940 ක් වීමට පෙර කාර්‍යක්ෂමතා කඩ ඉමෙන් සාමාර්ථ්‍යය ලැබීමට සුදුසුකම් ලැබීමෙ පරීක්ෂණයේ දී පහත සඳහන් ලඝුලේඛක යන් සහ ලඝු ලෙඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| දල්පද්දු, කේ. ඩබ්ලිව්. වී. | කම්කරු | ඉංග්‍රීසි |
| ද සිල්වා, ඩී. බී. ජී. | පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකගේ කාර්‍යාලය | ලඝු ලෙඛනය |
| ජයසුන්දර, ඕ. වී. | සෞඛ්‍ය | ඉංග්‍රීසි සහ සිංහල |
| කාලිෆ්, එම්. එෆ්. එච්. | දිස්ත්‍රික් උසාවිය, කෑගල්ල | සිංහල |
| තේවපාලන්, එල්. පී. (මහත්මිය) | ධීවර | ඉංග්‍රීසි සහ දෙමළ |
| ත්‍යාගරාජා, වී. | දිස්ත්‍රික් උසාවිය, යාපනය | දෙමළ |
| පෙරේරා, පී. ඩී. (මෙනෙවිය) | ජාතික නිවාස | ලඝු ලෙඛනය |
| විද්‍යාරත්න, වී. | ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | ලඝු ලෙඛනය |
| විල්සන්, ටී. එම්. | ජාතික වේතන ප්‍රතිපත්ති කොමිසම | ලඝුලෙඛනය |
| සිවගුරු නාදන්, එම්. පී. | යුද්ධ හමුදා මූලස්ථානය | දෙමල |

2. පහත සඳහන් අපේක්ෂිකාව සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| පෙරේරා, පී. ඩී. (මෙනෙවිය) | ජාතික නිවාස |

3. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් වීම පිණිස ඉහත සඳහන් කාර්‍යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති අපේක්ෂිකාව ද, එම පරීක්ෂණයට ඇතුළත්වීමේ සුදුසුකම් මීට කලින් ලබා ඇති අය ද, මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත්වීම සඳහා තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් මඟින් විභාග කොමසාරිස් වරයා වෙත ලියා පදිංචි කළ තැපැලෙන් යවන ලද ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතු යි.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960 ක්වූ මාර්තු මස 28 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### හම්බන්තොට කපු පර්යේෂණ මධ්‍යස්ථානයේ මුල් ඉදිරීම

හම්බන්තොට කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරි තැන විසින් හම්බන්තොට කපු පර්යේෂණ මධ්‍යස්ථානයේ මුල් ඉදිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 අප්‍රේල් මස 26 වෙනි දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. හම්බන්තොට කෘෂිකර්ම කාර්‍යාලයේ කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරි තැන ගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරි තැන, කෘෂිකර්ම කාර්‍යාලය, හම්බන්තොට" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම කොනෙහි හම්බන්තොට කපු පර්යේෂණ මධ්‍යස්ථානයේ මුල් ඉදිරීමේ ටෙන්ඩර් පත්‍රය යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් හම්බන්තොට කෘෂිකර්ම කාර්‍යාලයේ කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා ලන ලද කවරයෙහි "හම්බන්තොට කපු පර්යේෂණ මධ්‍යස්ථානයේ මුල් ඉදිරීමේ" ටෙන්ඩර් පත්‍රය යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරණ දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැණීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු හම්බන්තොට කෘෂිකර්ම කාර්‍යාලයේ කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර් කරුවන්ට උවමනානම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරණ වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩදෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැණීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී හම්බන්තොට කෘෂිකර්ම කාර්‍යාලයේදී ඒවා විවෘත කරණු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝරම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම් කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුටම ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව් දන්වා 10 දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන්කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් ගේ ලැයිස්තුවට ඇතුලත් වෙන්ට ඉඩ තිබේ.

7. නියමිත පෝර්මය ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන්

සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

8. ටෙන්ඩර් කරුවන් නම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවාවූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකම් අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීම ටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණි. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන් ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙනවා ද ඇත.

10. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ගෙවිය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමෙන්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළි ගැණීමේ බලය කෘෂිකම් අධ්‍යක්ෂක වෙත තබා ගනී.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩ කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකික යා" යන වචනයේ අර්ථ නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචිකරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත් තෙක් ය යන්නයි.

13. 1934 රේ, 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපණත /117 වැනි පරිච්ඡේදය යටතේ තමාගේ යම් කිසි සේවකයකු හෝ සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ලියුම් පත්‍ර ගැන වගකී මෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි

14. කොන්ත්‍රාත් කාරයාට බාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපි නයට තැපැලෙන් යැව්වොත් ඔහු අතටම බාර දුන්නා කොට සැළ කිය යුතුයි.

15. වැඩට ගැණීමට නුසුදුසුයයි කල්පනාකරනු ලබන යම් කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැණීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැණීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට තබාගණු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුලත්වූ හෝ තමාට සැහේයයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂක තැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරණ සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකට (3) වත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

18. වැඩි විස්තර හම්බන්තොට කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකම් ව්‍යාප්ත නිලධාරි තැනගෙන් දැන ගත හැක.

ඇම්. ඇර්ප්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ.

1960 මාර්තු 22 දා,
පේරාදෙණියේ දීය.

### මුල් ඉදිරීම පිළිබඳ විස්තර

හම්බන්තොට කපු පර්යේෂණස්ථානයේ අක්කර 25 ක පමණ මුල් ඉදිරීම, මුල් ඉදිරීමේදී අඟල් 18 ක් දක්වා ගැඹුරට සහ හරස් මුල් අඟල් 18 ක් දක්වා දිගට උදුරා දැමිය යුතුයි. එසේ ඉදිරූ මුල් නිලධාරියකු විසින් පරීක්ෂා කළාට පසු, පුළුස්සා දැමිය යුතුයි.

මුල් ඉදිරීම සහ පිලිස්සීම පොරොන්දු පත්‍ර අත්සන් කළ දින සිට දින 10 ක් තුලදී පටන් ගෙන, 1960 ජූලි මාසයේ 31 වෙනිදාට ප්‍රථම අවසන් කළ යුතුයි.

වැඩි විස්තර අවශ්‍ය නම් හම්බන්තොට කපු පර්යේෂණ ස්ථාන යේ කළමනාකාර තැන ගෙන් ලබාගත හැක.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

1. තංගල්ලේ දක්ෂිණ කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960. 5. 3 වෙනි දින පෙරවරු 10 දක්වා ඇඹිලිපිටිය උපකොට්ඨාශයේ ගිඹුර ගම්සභා පාර තැනීම සම්බන්ධ යෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 46,000 හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. ඇඹිලිපිටිය උපකොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පෝර්මවල එම වැඩයට ටෙන්ඩර් දෙක බැගින් ඉදිරිපත් කළ යුතුය.

3. 1960.4.26 සිට 1960.4.28 දින දක්වා කාර්යාල වේලාවල් තුළදී (දෙදිනම ඇතුළුව) ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීම සඳහා රු. 50 ක් ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් සහ ලියා පදිංචි කරන ලද පොතද ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුය.

ඇම්. ජේ. ඇර්ප්. ආර්. සේනාරත්න,
ඇඹිලිපිටිය උපකොට්ඨාශය භාර වාරිමාර්ග
ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්යාලය,
ඇඹිලිපිටිය.
1960.3.23.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බන්ඩාරවෙල ඌව කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරි මාර්ග ඉංජිනේරු තැන විසින් අලුත් නුවර වාරි මාර්ග උප කොට්ඨාශයේ දම්බරාව වැවේ දකුණු ඉවුරේ සොරොච්ච තැනීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1960 අප්‍රේල් මස 27 වෙනි දින පෙරවරු 10 වන තෙක් මෙම දෙපාර්තමේන්තුවේ රු. 15,000 ක් හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් පමණක් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් සමන්විත විය යුතුයි. අවශ්‍ය පෝරම අලුත් නුවර උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක. තවත් වැඩි විස්තර ආදියද ඔහුගෙන්ම ලබාගත හැකි අතර මේ ගැන ඇති සැලසුම් ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කළ හැකිය.

3. මෙම දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවන් බව ඔප්පු කළ හැකි හා රු. 25 ක් කච්චේරියක හෝ අලුත් නුවර වාරි මාර්ග කාර්යාලයේ තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සි යක් ඉදිරිපත්කළ අයවලුන්ට පමණක් 1960 අප්‍රේල් මස 25 වෙනි දින තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

ජේ. ගුණසේකර,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
අලුත් නුවර උප කොට්ඨාශය.

1960 ක්වූ මාර්තු මස 21 දින දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු දිශාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් රු. 9,000 සිට ඉහළට ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් වර්ෂ 1960ක්වූ අප්‍රේල් මස 19 වෙනි අඟහරුවාදා පෙරවරු 9.30 දක්වා "මනියාර්කුලම් වැව" ප්‍රතිසංස්කරණය සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. වවුනියා උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් වර්ෂ 1960ක්වූ අප්‍රේල් මස 18 වෙනි දින දක්වා ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක. තැන්පත් කළ යුතු මුදල රු. 25කි.

3. තවද මෙයට උවමනා සිමෙන්ති පමණක් සපයනු ලැබේ. වෙන කිසියම් ආවුද හෝ බඩු යනාදිය සපයනු නොලැබේ.

4. ආකෘති පත්‍රවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර දෙක බැගින් අමුනා මුද්‍රා තැබූ කවරවල බහා එම කවරයේ වම් කෙළවරේ අසවල් වැඩ සඳහා යයි විස්තර කළ යුතුයි.

5. වැඩි විස්තර සඳහා උ. කො. භාර වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කාර්යාලයෙන් ලබාගත හැක.

6. වර්ෂ 1960ක්වූ අප්‍රේල් මස 12 වෙනි දින පෙරවරු 9.30ට ටෙන්ඩර් ආකෘති පත්‍ර විවෘත කරනු ලැබේ.

වී. බාලසුබ්‍රමනියම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
උ. කො. වවුනියාව.

1960ක්වූ මාර්තු මස 25වෙනි දින දීය,

## ආහාර දෙපාර්තමේන්තුව

වර්ෂ 1960ක්වූ මැයි මස 1 වෙනි දින සිට 1960ක්වූ සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා කාලය තුළ පහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර් 1960ක්වූ අප්‍රේල් මස 22 වෙනි සිකුරාදා පස්වරු 2.30 දක්වා කොළඹ යූනියන් පෙදෙසේ (අංක 569 දරණ තැපැල් පෙට්ටිය) ආහාර, වාණිජ සහ වෙළඳ අමාත්‍යාංශයේ (ආහාර, වෙළඳ සහ සමූපකාර අංශය) ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

සේවය : කුරුණෑගල දිස්ත්‍රික් ධාන්‍යාගාරයේ සිට මහනුවර සහ රඹුක්කන පිහිටි ආහාර ගබඩාවලට ආහාර සහ කිරි පිටි ලොරිවලින් ගෙනයාම.

කොළඹ යූනියන් පෙදෙසේ ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් 1960ක්වූ අප්‍රේල් මස 22 වෙනි සිකුරාදා දවල් 12 තෙක් ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් (පිටපත් දෙකකින්) ඉදිරිපත් කළ යුතුවේ. ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීම සඳහා ආහාර කොමසාරිස් වෙත රු. 100ක් තැන්පත් කොට ලබා ගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුවාත් හැර විස්තර ප්‍රකාශනයේ 4 (II) සහ (III) දරණ ඡේදයන්හි සඳහන් ලියවිලිද ඉදිරිපත් කළ යුතුවේ. මෙම විස්තර ප්‍රකාශනයද අමතර විස්තර ද ආහාර කොමසාරිස්ගේ කාර්යාලයෙන් ලබාගත හැකිවේ.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

330, යූනියන් පෙදෙස,
කොළඹ,
1960 මාර්තු මස 25 දින.

---

## උසස් කරණ ලද මුස්ලිම් හා දෙමළ පාසල්වලට පුස්තකාල පොත් සැපයීම—1959/1960

කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 අප්‍රේල් මස 22 වැනි කිවිදින පස්වරු 2.30 දක්වා ඉහත සඳහන් පුස්තකාල පොත් සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන්නන් විසින් කොළඹ 2, මලයි වීදියේ සැපයීමේ ශාඛාවේ අධ්‍යාපනාධ්‍යක්ෂ වෙත ඉල්ලුම් කළවිට විස්තර නොමිලයේ සපයනු ලැබේ.

3. කොළඹ ටෙන්ඩර් කරුවන් විසින් කොළඹ 2, මලයි වීදියේ ඒ. සී. ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද කොළඹින් පිටත ටෙන්ඩර් කරුවන් විසින් කොළඹින් පිටත ඕනෑම කච්චේරියකද රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමේදී කාර්යාලය වැඩ කරන කාලය තුළ 60.4.21 දක්වා ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

එල්. ඩී. එස්. කරුණාරත්න,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

1960 මාර්තු මස 28 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැන විසින් 1960.4.22 දින පෙරවරු 9.30 දක්වා පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| පාසැලේ නම | වැඩ විස්තර |
|---|---|
| (1) බදි/බදුල්ල දෙවු පාසැල | කටු කම්බි වැටක්. |
| (2) බදි/උඩගම වැල්ගොල්ල මිශ්‍ර පාසැල | ජල නළ යෙදීම. |

සංලක්ෂ්‍යය : බදි=බදුලු දිස්ත්‍රික්කය

2. ගොඩනැගිලි වැඩ සම්බන්ධව පහත සඳහන් දෙපාර්තමේන්තුවල ලියා පදිංචි වී ඇති අයට 1960.4.21 දින දවල් 12 දක්වා ටැන්ඩර් ඉල්ලුම් පත්‍ර දෙනු ලැබේ.

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ

අංක 1 සඳහා රු. 10,000න් සහ ඉහල
අංක 2 සඳහා රු. 5,000න් සහ ඉහල

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ

අංක 1 සඳහා රු. 15,000න් සහ ඉහල
අංක 2 සඳහා රු. 5,000න් සහ ඉහල

සහ ලියා පදිංචි ඇති සමූපකාර සමාගම්, ග්‍රාම සංවර්ධන සංගම් සහ කම්කරු සමාගම්. අදාලවන පරිදි සමූපකාර සමාගම් රෙජිස්ට්‍රාර් තැනගෙන්, ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන්, කම්කරු කොමසාරිස් තැනගෙන් බාර ගන්නා වැඩය පහත සඳහන් මුදලට අඩුනොවන මුදලකට හොඳින් කිරීමට පුළුවන් බව දක්වෙන සහතිකයක් බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරිතැනට ඉදිරිපත් කිරීමට හැකිනම් පමණි ඉහත සඳහන් සංගම් වලට ටෙන්ඩර පත්‍ර දෙනු ලබන්නේ.

අංක 1 දරණ වැඩ සඳහා රු. 15,000
අංක 2 දරණ වැඩ සඳහා රු. 5,000

මේ සඳහා රු. 100 ක මුදලක් කොළඹ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිටස්තර කච්චේරියක තැන්පත් කොට ඒ රිසිට් පත බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කළ යුතුයි. මුදල් මිස චැක්පත්, මනිඕඩර පෝස්ටල් ඕඩර් භාරගනු නොලැබේ. අනුමත සමිති තැන්පත් කරනු ලබන මුදලින් නිදහස් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීම සඳහා මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය මුදල් ගෙවීමේ කුවිතාන්සි, කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ ඌව පලාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. මුදල් ගෙවීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ දෙවන ඡේදයේ සඳහන් පරිදි ලියා පදිංචි වී සිටින බව ඔප්පු කළ හැකි අයට පමණි.

4. ඉහත සඳහන් පරිදි පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍රිකා ඌව පලාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. මේ සම්බන්ධ සැලැස්මවල් හා සියළුම වැඩ විස්තර බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැනට ටෙන්ඩර් පත්‍රිකා, ලියා පදිංචිකළ තැපැලෙන් යැවිය යුතුයි. දේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍රිකා ලියා පදිංචි කළ තැපැලෙන් එවීමට අකැමැති නම් ඔවුන් හෝ ඔවුන්ගේ ඒජන්තවරුන් සීල් තබන ලද ටෙන්ඩර් බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාල සහකාර තැනට භාර දී එසේ භාරගත් බවට ඒ විගසම ලියවිල්ලක් ලබා ගත යුතුයි.

5. බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ දී 1960.4.22 දින පෙරවරු 9.30ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ ගණන් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ.

6. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයේ සිට සති හයක කාලයක් තුල විවෘතව තැබිය යුතුයි.

7. ටෙන්ඩර් කරුවන් විසින් සේවය සඳහා බඳවාගත හැක්කේ එම වැඩකරන ප්‍රදේශයේ පදිංචි පුහුණු හෝ නුපුහුණු ලාංකික කම්කරුවන් පමණි. මෙය කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් වශයෙන් සලකන බවත් එසේ කිරීමට අසමත් වන කොන්ත්‍රාත් කරුවන් කොන්දේසි කඩකළවුන් හැටියට සලකනු ලබන බවත් සැලකිය යුතුයි. විශේෂ හේතූන් උඩ අධ්‍යාපන අධ්‍යක්ෂ තැන අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තුමා සමග සාකච්ඡා කොට ලාංකික නොවන කම්කරුවන් හෝ වෙන ප්‍රදේශවල පදිංචි කම්කරුවන් යෙදවීමට අවසරයක් දුන්නොත් හැර එසේ අවසරයක් නොමැතිව එ වැනි කම්කරුවන් සේවයේ යෙදවීම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතුවන බව සැලකිය යුතුයි. අනුමැතියක් හෝ සම්මතියක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් හෝ වෙන ප්‍රදේශවල පදිංචි කම්කරුවන් හෝ යෙදවීම තහනම්ය.

8. අනුමත කරන ලද තත්වයේ උළු නැතැයි ගොඩනැගිලි පරීක්ෂක තැන විසින් සහතික කළහොත් මිස මෙරට නිපදවන උළු පාවිච්චි කළ යුතුයි. මේවායේ තත්වය පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් ඒ පිළිබඳ පරීක්ෂණ ලංකාවේ රසායනික සහ කාර්මික පර්යේෂණාගාරය මගින් පවත්වනු ඇත. ඒ සඳහා යන වියදම් සපයන්නා විසින් දැරිය යුතුයි.

ඊ. නාගොඩවිතාන,
බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කාර්යාලය, බණ්ඩාරවෙල,
1960. 3. 25.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960.4.22 දින පස්වරු 2.30 දක්වා පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| පාසැලේ නම | වැඩ විස්තර |
|---|---|
| (1) බදි/බිබිලේ මධ්‍ය මහා විද්‍යාලය | විශාල අලුත්වැඩියා. |
| (2) බදි/මොනරාගල දෙවු පාසැල | උපගුරු නිවාසයක්. |
| (3) බදි/බෝගොඩ තලාව රජයේ මිශ්‍ර පාසැල | පාසැල් ගොඩනැගිල්ලක් සහ වැසිකිළි. |
| (4) බදි/මහඔය රජයේ මිශ්‍ර පාඨශාලාව | අලුත්වැඩියා, වැඩිදියුණු කිරීම්, ළිඳක් සහ වැසිකිළි |

සංලක්ෂ්‍යය : බදි=බදුලු දිස්ත්‍රික්කය

කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1960 ක්වූ අප්‍රියෙල් මස 1 වෙනි දින දිය.

---

## පිටරටවලින් ගෙන්වන සහ දැනට තිබෙන තොගවලින් ටොන් තුනේ ලොරි සැපයීම සහ භාරදීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු හා කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සපයා ලූක්මන්ජී ස්කුවයාර්හි පිහිටි ඔහුගේ ගබඩාවට බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1960 ක්වූ මැයි මස 18 වන බදාදා දවල් 12 දක්වා ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 547, කොළඹ) විසින් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි අනුව ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළයුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්ම වලයි. වර්ෂ 1960 ක්වූ මැයි මස 13 වෙනි දින වන තෙක් ටෙන්ඩර්පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1960 ක්වූ මැයි මස 19 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10 ට ප්‍රවාහණ හා වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටැන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටැන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540, කොළඹ,
1960 ක්වූ අප්‍රියෙල් මස 1 වෙනි දින දිය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

පාදුක්ක පොලිසියේ වැසිකිළි සෑදීම සඳහා 1960 පෙබරවාරි මස 26 දින අංක. 12,068 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ ටැන්ඩර් දැන්වීම මෙසින් අවලංගු කරනු ලැබේ.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ
වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 1960.3.26.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

වාරියපොල පොලිසි භූමියේ ලිඳක් කැනීම සඳහා 1960 මාර්තු මස 4 දින අංක. 12,073 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ ටැන්ඩර් දැන්වීම සම්බන්ධව යි.

ඉහත සඳහන් වැඩේට ටැන්ඩර් පෝර්ම ලබා ගන්නා අන්තිම දිනය හා ටැන්ඩර් පත්‍ර භාරගන්නා අන්තිම දිනය පිළිවෙළින් 60.4.8 දින සහ 60.4.20 දින දක්වා කල් දමා ඇති බව මෙසින් දන්වනු ලැබේ.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ
වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 1960.3.26.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

**දකුණු කොළඹ නගරවලට ජලය සැපයීමේ ක්‍රමය—දෙවෙනි අවස්ථාව—1960 පෙබරවාරි මස 19 වෙනි දින අංක 12,064 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ ටැන්ඩර් දැන්වීමයි**

ඉහත සඳහන් ජලය සැපයීම සඳහා ටැන්ඩර්පෝර්ම ලබා ගන්නා අන්තිම දිනය 60.4.25 දා තෙක් කල් දමා ඇති බවත්, ටැන්ඩර් පත්‍ර භාරගන්නා අන්තිම දිනය පෙරසේම 60.6.15 දාට නියම වී ඇති බවත් මෙසින් දන්වනු ලැබේ.

සී. රාසසියා,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ
වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 1960.3.24.

---

කොළඹ මරදානේ ට්‍රිපොලි වෙළඳ සැලේ සේවකයන්ට වැසිකිළි සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 අප්‍රියෙල් මස 27 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ, ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ නැගෙනහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 අප්‍රේල් මස 22 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි සහ ජලය සැපයීමේ වැඩ සඳහා රුපියල් 5,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "වෙනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්",

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති., සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.3.26.

---

යාපනේ කච්චේරියේ වැසිකිළිය අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 අප්‍රියේල් මස 27 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. යාපනේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 අප්‍රේල් මස 22 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 7,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්

කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් ",

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති., සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.3.26.

---

කොළඹ කාසල් වීදියේ ආරෝග්‍යශාලාවේ මාතෘ වාට්ටුවේ ශල්‍යාගාරය අළුත්වැඩියා කිරීම හා එහි ඉතිරි වැඩ නිම කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 මැයි මස 18 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 මැයි මස 6 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 35,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් ",

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති., සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.3.26.

## විශේෂ නිවේදනයයි

1960 අප්‍රේල් 13 වැනි බදාදා සහ අප්‍රේල් 15 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1960 අප්‍රේල් මාසයේ තුන්වැනි සුමානයේ ගැසට් පත්‍රය, 1960 අප්‍රේල් 14 වැනි බ්‍රහස්පතින්දා නිකුත් කරන බැවින්, එහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 අප්‍රේල් 8 වැනි සිකුරාදා පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 මාර්තු 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශොධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ** මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම **පස්වරු 3.30ට** සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් **කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 14 |

15. **පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.